Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සති පාසල

විෂය- පෙරදිග සංගීතය

ජූලි මාසය - 1 සතිය

ශ්‍රේණිය - 9

සැකසුම - ඩබ්.එන්.ජී.චන්ද්‍රකාන්ති
ර/ නිවි/ ඇලපාත මහා විද්‍යාලය

**නිපුණතාව 2.0 - වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 2 .1 - වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.**

**ක්‍රියාකාරකම 2.1 - විවිධ ස්වර ස්ථාන ශ්‍රැති කර ගනිමින් ස්වර පුවරුවෙන් ගීත වාදනය කරයි.**

*(ස්වර අෂ්ටකය සඩ්ජ භාවයෙන් ,මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියා දැක්වීම)*

2.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02, 03 පැවරුම් සම්පූර්ණ කරන්න.

## පැවරුම- 01

පහත දක්වා ඇත්තේ ෂඩ්ජ භාවයෙන් බිලාවල් හා කාෆි යන රාගවලට අයත් ආරෝහණයයි. එය හොඳින් අධ්‍යයනය කරන්න. එහිදී කාෆි රාගයේ ස්වරයන්හි අන්තරය විමසන විට 2-3 සහ 6-7 ස්වර අතර අන්තරයක් නොමැති බව ඔබට වැටහෙනු ඇත.

බිලාවල්

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | රි | රි | ග | ග | ම | ම | ප | ධ | ධ | නි | නි | ස් |
| ස | | රි | | ග | ම | | ප | | ධ | | නි | ස් |
| 1 | | 2 | | 3 | 4 | | 5 | | 6 | | 7 | 8 |

කාෆි

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | රි | රි | ග | ග | ම | ම | ප | ධ | ධ | නි | නි | ස් |
| ස | | රි | ග | | ම | | ප | | ධ | නි | | ස් |
| 1 | | 2 | 3 | | 4 | | 5 | | 6 | 7 | | 8 |

❖ ඉහත දැක්වෙන පරිදි කාෆි රාගයේ සඩ්ජ භාවයේ පරතරය අනුගමනය කරමින්,

1. කාෆි ආරෝහණ අවරෝහණ මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියන්න.

11. ලියා දක්වන ලද ආරෝහණ අවරෝහණය ස්වර පුවරුවකින් වාදනයට හුරු වන්න.

## පැවරුම - 02

සඩ්ජ භාවයෙන් (ස ස්වරය මූලික කොට ගෙන) සටහන් කර ඇති පහත ස්වර ස්ථාපන ගී පාදය මධ්‍යම භාවයෙන් (ම ස්වරය මූලික කරගනිමින්) හා පංචම භාවයෙන් (ප ස්වරය මූලික කර ගනිමින්) ලියා දක්වන්න.

ස ස රි රි /ග - ම -/ස රි ග ම/ප ධ ප -

## පැවරුම - 03

1. 6/7/8 ශ්‍රේණිවල ඔබ උගත් ස්වර ස්ථාපන ගීතවල ස්වර ප්‍රස්තාර හෝ ඔබට සපයා ගත හැකි නිල් අහස් තලේ අගේ, දියගොඩ සැමතැන වැනි සරල ස්වර ප්‍රස්තාර කිහිපයක් මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියන්න. වාදනය කරමින් ස්වරස්ථානවල වෙනස වටහා ගැනීමට උත්සාහ කරන්න.